




මහාචාර්ය
ආරිය ලගමුව

# නිදහස් ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය, මහජනතාව සහ ජගත් සංස්කෘතික උරුමය

ශ්‍රී ලංකාද්වීපය ස්වාධීන රාජ්‍යයක් වශයෙන් සංවිධානය වූයේ ක්‍රි.පූ. 6 වන සියවසේ විජය රජුගේ කාලයේ සිට හෝ ක්‍රි.පූ. 3 වෙනි සියවසේ දේවානම්පියතිස්ස රජුගේ කාලයේ සිට ලෙස සළකන්නේ නම් එදා සිට අද දක්වාම ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ස්වාධීන රාජ්‍යය කි. අපේ මව්බිම වරින්වර පරසතුරු ආක්‍රමණවලට ලක් වූ අතර විජාතික ආක්‍රමණිකයන් සමහර අවස්ථාවලදී තාවකාලික ව මෙරට පාලනය කළ නමුදු ඒ හැම විටම අපේ රජවරු ඔවුන්ගෙන් රට බේරා ගත් හ. අවසාන වරට දිවයින යටත් විජිතයක් කරගෙන පාලනය කළ බ්‍රිතාන්‍යයන්ගෙන් රට නිදහස් කරගත් දා සිට නිදහස් රාජ්‍යයක් ලෙස වර්තමානයේ පොදු වශයෙන් සලකන නමුදු මෙහිලා අදහස් කරන්නේ මේ රට රාජ්‍යයක් වශයෙන් ආරම්භ වූ තැන් සිට මේ වන තෙක්ම නිදහස් රාජ්‍යයක් ය යන පුළුල් අර්ථයෙනි.

ඒ අනුව නිදහස් රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ජාතික හා ජගත් සංස්කෘතික උරුමය හදා වඩා ආරක්ෂා කර ගෙන වර්තමාන පරම්පරාවට භාරදුන් රජවරුන්, මහා සංඝරත්නය හා පොදු මහ ජනතාව ගේ කාර්යභාරය පිළිබඳ ඇගයීමක් කිරීම ත් අමිල වූ ඒ ජගත් සංස්කෘතික උරුමයේ වටිනාකම

හා වැදගත්කම ත් ඒවා විනාශ වන ආකාරය ත් ඒවා සුරක්ෂිත කර ගත යුතු ආකාරය ත් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ත් ඒ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙහි ලා පූජ්‍ය, පූජක දෙපාර්ශ්වයට ත් මහජනතාවට ත්, මෙරට පාලකයන්ට ත් භාර වගකීම්, යුතුකම් කවරේ ද යන්න ත් මෙහි ලා සාකච්ඡා වනු ඇත.

ක්‍රිස්තු පූර්ව පස්වෙනි සියවසේ පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිට ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය රජුගේ ඇගයීම්, අදහස් හා වටිනාකම් පදනම් කරගෙන නිර්මාණය විය. එහෙත් ක්‍රි.පූ. 3 වෙනි සියවසේ දේවානම්පියතිස්ස රජුගේ කාලයේ සිට ඉන්දියාවේ රාජ්‍ය පාලන ක්‍රමය ත් බුදු දහම ත් මඟින් මෙහෙයවනු ලැබූ ශ්‍රී ලංකාවේ පාලකයාගේ පාලන ප්‍රතිපත්ති 'දසරාජ ධර්මය' අනුව සකස් විය. විශේෂයෙන් ම දේවානම්පියතිස්ස රජුගේ සමකාලීන අදෘෂ්ඨ මිත්‍රයා වූ ධර්මාශෝක රජු බෞද්ධයකු වූ අතර එතුමා දසරාජධර්ම ප්‍රතිපත්තිය මත පදනම් වූ පාලන තන්ත්‍රයක් පවත්වාගෙන යෑම ශ්‍රී ලංකාවේ රජු කෙරෙහි ද තදබල ලෙස බලපෑවේ ය. මහාවංශයේ රජු හඳුන්වා තිබෙන්නේ 'භූමිපති', 'මහීපති' හා 'පෘථිවීශ්වර' යනාදි නම්වලිනි. එයින් අදහස් වන්නේ 'මහපොළව (රට) පාලනය කරන්නා' යන්න යි. මනුනීති සංග්‍රහයේ (මනුස්මෘතියේ) රජුට රට පාලනය කිරීමට විශේෂ බලයක් ඇති බව සඳහන් වෙයි. ගයිගර්ගේ මතය අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන තන්ත්‍රය බොහෝ දුරට ඉන්දියාවේ මෙන් පරම රාජ්‍ය ආණ්ඩුවක් වන අතර රජු රාජ්‍ය නමැති පිරමීඩයේ ශිඛරය ද දේශපාලන බලයේ කේන්ද්‍ර ස්ථානය ද වෙයි. එහෙත් ගයිගර්ගේ මතය ලක්දිව රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් පරම සත්‍ය නොවන බව ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය විශ්ලේෂණය කර බලන විට පැහැදිලි වෙයි.

ක්‍රි.පූ. 3 සියවසේ රචිත බ්‍රාහ්මී ලෙන් ලිපි ඇතුළු පසුකාලීන සෙල්ලිපිවල මෙරට රජුට ගමණි, මහරජ, දෙවනපිය, ගමණී අභය වැනි අභිධාන හෙවත් උපාධිනාම කිහිපයක් ඇතුළත් වෙයි. 'ගමණී' යන උපපදය සිය නමට එකතු කරගත් රජවරුන් අතර දුට්ඨ ගාමිණී, වට්ටගාමිණී, ආමණ්ඩ ගාමිණී යනාදි රජවරුන් විශේෂයෙන් සඳහන් කළ හැකි ය. මහාචාර්ය පරණවිතාන පවසන පරිදි ගාමිණී යන නාමය සිය නමේ අගට භාවිත කරන ලද්දේ පොදු ජනතාව විසින් තොරාගන්නා ලද රජවරුන්ට ය. ඒ අනුව ගයිගර් මතය නිෂේධනය වෙයි.

මහාවංශයේ සඳහන් වන පරිදි භූපතිත්වයේ සප්තාංගයන්ගෙන් පළමු වැන්න (පුද්ගලයා) රජු ප්‍රධාන අමාත්‍ය මණ්ඩලය යි. ගයිගර්ගේ මතය

අනුව රාජ්‍ය පාලනයේ මුළු මහත් බලපරාක්‍රමය ම රජු සතු වූ අතර මුළු රටේ ම හා සියලු ම පුරවැසියන්ගේ අභිවෘද්ධිය සැලසීම පිළිබඳ සම්පූර්ණ වගකීම රජු සතු වේ. රාජ්‍ය නිලධාරීන් රජුගේ කාර්යභාරය ක්‍රියාත්මක කිරීමේ සහායකයන් බව ද ඔහු කියයි. රටේ භූමිය රජු සතු දේපළ කි. එහෙයින් භූමියේ තිබෙන සියලු ම සම්පත් ද රජුට අයත් වේ. ඔහු මේ සම්පත් ආරක්ෂා කිරීමේ වගකීම ද දැරුවේ ය. සම්පත් හා වැසියන්ගේ ආරක්ෂාව සැලසීම වෙනුවෙන් පුරවැසියන් විසින් රජුට බද්දක් ගෙවිය යුතු ය. "රටවැසියන්ගේ ත් රටේ ත් ප්‍රවර්ධනය එකිනෙකට සම්බන්ධ වූ අතර ඒ දෙක ම වෙනුවෙන් රජු කැප වී සිටියේ ය. සියලු ම ඉඩ කඩම්වල අයිතිය රජුගේ ය. ඉඩම්වලින් ආදායම ලබා ගන්නට වැසියන්ට අවසර තිබුණ ත් ඉඩම්වල අයිතියක් ඔවුන්ට හිමි නො වී ය. ස්වභාවික සම්පත් රජුගේ වස්තූන් විය. අවශ්‍ය ඕනෑ ම විටක ශ්‍රම සේවාව කැඳවීමට ත් ඒ ශ්‍රමය විවිධ කාර්යයන් සඳහා භාවිත කිරීමට ත් රජුට අයිතිය තිබුණි. එහෙත් රජු ඒ සියල්ල පරිහරණය කරන ලද්දේ රටේ ත් වැසියන්ගේ ත් සුභසිද්ධිය උදෙසා මිස හුදෙක් රජ සැප විඳීමට නොවේ. දුටුගැමුණු මහ රජුගේ රුවන්මැලි සෑය ඉදිකිරීමේ පුවතේ සඳහන් වන පරිදි ශ්‍රමය වෙනුවෙන් ජනතාවට විවිධ ගම්බිම්, ධන, ධාන්‍ය, දේපළ පමණක් නොව චේතන පවා ලබා දී තිබේ. කිසිවිටක ත් බලහත්කාරයෙන් ශ්‍රමය සූරාකෑමක් සිදු නොවූ අතර විවිධ වැරදිවලට දඬුවම් ලැබූවන්ට දඬුවමක් ලෙස වැව් සෑදීම, මංමාවත් සෑදීම, වෙහෙර විහාර පවිත්‍ර කිරීම හා පිළිසකර කිරීම වැනි රටට ත් වැසියන්ට ත් ප්‍රයෝජනවත් වන කටයුතු කිරීමට පමණක් නියම විය.

රාජ්‍යත්වයට පත් වීමට නියමිත කුමාරයා මනා අධ්‍යාපනයක් ලැබිය යුතු ය. බෞද්ධ දර්ශනය, අර්ථ ශාස්ත්‍රය, කාව්‍ය, ව්‍යාකරණ නීති පමණක් නොව නිඝණ්ඩු යනාදි විෂය ධාරාවන් පවා මැනවින් ප්‍රගුණ කළ යුතු ය. සමහර රජවරුන් ඉන්දියානු ශිල්ප ශාස්ත්‍රවල ප්‍රවීණතාවක් දැරූ බව සඳහන් වෙයි. 2 වෙනි පරාක්‍රමබාහු රජු මනු නීතිය පිළිබඳ මනා පරිචයක් ඇතිව මනු නීතිය නො ඉක්මවා රාජ්‍ය පාලනය ගෙන ගිය බව චූලවංශයේ සඳහන් වෙයි. මහාපරාක්‍රමබාහු රජු රාජධර්ම අනුව ධාර්මිෂ්ඨ පාලනයක් ගෙන ගියේ ය. පැරණි ලක්දිව රජවරුන් විසින් නීති, රීති, රෙගුලාසි හා අඥාවල් වරින් වර පැනවූ නමුත් ඒ සියල්ල රටේ ත්, වැසියන්ගේ ත්, ආගමේ ත් යහපත උදෙසා ම විය. එසේම රජවරුන් විසින් කිසිවිටකත් තදබල නීති රීති පණවා දැඩි ලෙස වැසියන් පීඩාවට පත් කළේ නැත. සමාජයට අවශ්‍ය වන අකාරයට ත් සුදුසු ආකාරයට ත් හැඩගැසීමට සුදුසු වන පරිදි නීති-රීති විකාශනය වීමට ඉඩ හළේ ය. එසේම සමාජයේ පවත්නා චාරිත්‍ර වාරිත්‍ර තුළින් රටේ යහපත

සඳහා නීති, රෙගුලාසි ඉස්මතුවීමට ඉඩ කඩ තබා තිබුණි. ඒ නීති-රීති හා චාරිත්‍ර වාරිත්‍රවලට බොහෝ දුරට පදනම් වූයේ බුදු දහම යි. එහෙයින් පුරවැසියාට පමණක් නොව පරිසරයට හා සතා සිවුපාවුනට පවා යහපතක් මිස කිසිවිටෙක අයහපතක් සිදු නොවී ය. සමාජ සංස්ථා ආරක්ෂා කිරීමට ඇපකැප වූ රජවරු සිරිතට හා සම්ප්‍රදායට එකඟ ව රට පාලනය කළ හ. සමාජයේ ත් රටේ ත් පමණක් නොව මුළු විශ්වයේ ම යහ පැවැත්ම රඳා පවතින්නේ රජුගේ ක්‍රියාකාරකම් පදනම් කරගෙන ය. සිරි සඟබෝ රජුගේ ධර්මිෂ්ඨ භාවය තුළින් රට සශ්‍රීක වීමට ත් දුර්භික්ෂ බිය නැසීමට ත් වැසි ලැබුණි. 4 වෙනි සේන රජුගේ දැහැමි ගුණය නිසා කලට වැසි ලැබුණි. එයින් ස්වභාව ධර්මයා පවා යහපත් පාලනය කෙරෙහි දැක්වූ යහපත් ප්‍රතිචාරය මැනවින් පෙනේ. ඒ නිසා ම පරිසරය, කාලගුණය හා දේශගුණය පවා යහපත් වූ ආකාරය මැනවින් පෙනේ. රට සශ්‍රීක විය.

බෞද්ධ භික්ෂූන් සමග රජු නිරන්තර ව සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යන අතර උන්වහන්සේගේ අවවාද අනුශාසනා හා මඟ පෙන්වීම ඔස්සේ ධර්මිෂ්ඨ පාලනයක් ගෙන යන්නට රජුට ශක්තිය ලැබුණි. එසේම බුදු දහම අනුව භික්ෂූන්වහන්සේ ද රජු ට සවන් දුන් හ. කිසියම් අර්බුදකාරී අවස්ථාවකදී රජුගේ ඉල්ලීම අනුව භික්ෂූන් ක්‍රියා කළ ආකාරය දුටුගැමුණු හා මහාපරාක්‍රමබාහු වැනි රජවරුන්ගේ කාලවලදී සිදුවූ සිදුවීම්වලින් තහවුරු වේ. විශේෂයෙන් ම රජු බෝසත්වරයෙකු විය යුතු ය. එහෙයින් 'නොබොහොසත්හු නොරජ්වන්හ' යි 'බෝධිසත්වයන් නොවන්නෝ රජ නොවිය යුතු යැ' යි පිළිගැනීමක් ද ඇතිවිය. බුදු දහම අනුව රාජ්‍ය පාලනය කළ යුත්තේ දසරාජ ධර්මයට අනුකූලව ය. දසරාජ ධර්මය යනු දාන, ශීල, පරිත්‍යාග, අජ්ජව (ඍජු බව) මජ්ජව (මෘදු ගුණය) තපෝ (ආත්ම සංයමය) අක්කෝධ (ක්‍රෝධ නොකිරීම) අහිංසා (අවිහිංසාව) ඛන්ති (ඉවසීමේ ගුණය) අවිරෝධතා (අවෛරය) යන ගුණ දහය යි. එසේම ඒ සමග ම දසකුසල් හෙවත් දස පුණ්‍ය ක්‍රියා ද කළ යුතු විය. මේ ගුණාංග රජ කෙනකු තුළ තිබෙන විට ඔහු කිසි විටෙක අත්තනෝමතික පුද්ගලයෙකු නොවන්නේ ය. අනික් අතට මහසංඝයාට ත් රටවැසියාට ත් ඔහු වගකිව යුතු ය. තව ද රජු දේශපාලන න්‍යායයන් හා කලාශිල්ප ප්‍රගුණ කරන ලද බුද්ධිමතෙකු විය. මේ සියල්ල සංකලනය වූ පුද්ගලයා සක්විති රජ කෙනෙකු වුව ද ඔහු ඒකාධිපතියෙකු නම් නොවන්නේ ය. රජු රටේ භාරකරුවා හා පාලකයා මිස අයිතිකරුවා නොවේ. ඓතිහාසික මූලාශ්‍රයයන්, පුරාණ සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ, දේශාටන වාර්තා හා ශිලා ලේඛන යනාදියේ සඳහන් වන පරිදි භික්ෂූන්, රජවරුන්, උප රජවරුන්, සේනාධිපතිවරුන්, රාජ්‍ය නිලධාරීන්, විවිධ ශිල්පීන්

හා මහජනතාව යන සියලු ම කණ්ඩායම්වල සහභාගිත්වයෙන් පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය ගෙන ගියේ ය. ප්‍රකට රෝම ගත්කතුවරයා වූ ප්ලීනිගේ වාර්තාවේ ඒ බව මෙසේ සඳහන් වෙයි.

'වාල්ලු කියා කොටසක්වත් වහල් වෙළඳාමක්වත් නොමැති ය ..... වැසියන් අතරින් තෝරා ගන්නා තිස් දෙනෙකුගෙන් යුක්ත මන්ත්‍රණ සභාවක් රජුට තිබේ. රජු ස්වකීය රාජ්‍ය බලය ඉක්මවා නොපනත් කමක් කළහොත් මුළු රටවැසියා ඔහු පිළිකුල් කිරීමෙන් ඊට දඬුවම් ලබන්නේ ය'.

ඒ අනුව රජුගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන යාන්ත්‍රණය ක්‍රියාත්මක කළ නිලමඬුල්ල පොළොන්නරුවේ නිශ්ශංකමල්ල රජුගේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ එකිනෙක ශෛලස්තම්භවල රචනා කර තිබෙන සෙල්ලිපි පාඨවල සඳහන් වන නම් ගම්වලින් හෙළිදරව් වෙයි. එමගින් ප්ලීනිගේ ප්‍රකාශයේ සත්‍යතාව පැහැදිලි වෙයි. එම සෙල් කණු පේළිවල ජනසම්මතවාදී පාලක මණ්ඩලය වන රජු, උපරජු, සෙනෙවිවරුන්, ඈපා, මාපා, මහලේකම්, මහරැටිනා, අනුනා, සභාපතිනා, සිටුනා, සිරිත් ලේනා, දුලේනා, වියත්තා, මහවෙදනා, මහ නැකතිනා, දහම් පසක්නා යනාදීන් සඳහන් වෙයි. එසේම දිවයිනේ සතර දිග්භාගයේ ව්‍යාප්ත වී තිබෙන බොහෝ සෙල්ලිපිවල ද මේ තනතුරු නාම සඳහන් වෙයි. එසේම ඊට පහළ නිලධාරීන් කණ්ඩායමක් පිළිබඳ ව ද ශිලා ලේඛනවල මෙන්ම ඓතිහාසික මූලාශ්‍රයයන්වල සඳහන් වෙයි. ඒ අතරින් ගම්ලදු, දසගම් ඇත්තන්, රටලදු, භාණ්ඩාර පොතුන්, සම්දරු හා කුඩසලා යන නිලධාරීන් නිතර සඳහන් වෙයි.

පණ්ඩුකාභය රාජ්‍ය සමයේ රට මිණුම් ගත කර ගම් දනව්වල දේශසීමා සලකුණු කළ බව මහාවංශයේ සඳහන් වෙයි. ගම් පාලනය සඳහා 'ගම්සභා'ක්‍රමය ආරම්භ කරන ලද්දේ ද මෙම රජු විසිනි. ගමරාළ හෝ මහගමයා ගමක ප්‍රධානියා වූ අතර ඔහු තෝරාගන්නා ලද්දේ ගම් වැසියන් විසිනි. ඒ සඳහා ගම් දහයක ප්‍රධානීන්ගෙන් කෙනෙකු තෝරාගත් අතර ඔහු 'දසගම් ඇත්තා' හෙවත් 'ගම්මුත්තා' වූ අතර ඔහු ගම් දහයක් පාලනය කළේ ය. දසගම් ඇත්තන් අතරින් තෝරා ගත් තැනැත්තා ''රටලද්දා'' හෙවත් රට ලදු විය. ඔහු ''දිස්ත්‍රික්කයක්'' හෙවත් ''පළාතක්'' පාලනය කළේ ය. එවැනි දිස්ත්‍රික්ක හෝ පළාත් කිහිපයක් එකතුවෙන් සැදුම් ලත් විශාල පළාතක් ඈපා හා මාපාවරුන්ගේ පාලනය යටතේ විය. මුළු රට ම මහරජුගේ පාලනය යටතේ තිබුණි. පසුකාලය වනවිට මෙම පාලන ඒකක තවදුරටත් විකාශනය වීමෙන් 'මහග්‍රාමය' හා 'වණික් ග්‍රාමය' බිහිවිය. වණික් ග්‍රාම බිහිවීමෙන් අදහස් වන්නේ නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය පාලනය

තුළ ජාතික හා ජාත්‍යන්තර වෙළඳාම වර්ධනය වූ බව යි. එය විදේශීය රටවල් සමග දේශපාලන, ආර්ථික හා ආගමික සම්බන්ධතා වර්ධනය වීමට ත් තහවුරු වීමට ත් හේතුවිය. වෙළෙඳ මණ්ඩලයක නායකයා හෙවත් සභාපතිවරයා 'සෙට්ටි' නමින් හැඳින්වී ය. ඔහු රාජ්‍ය සභාවේ සමාජිකයෙකු ද විය. මාන්තේයි, ගෝඨපබ්බත, ජම්බුකෝළ වැනි වෙරළාසන්න තොටුපොළ වල් හෝ වරායවල් ආශ්‍රිත ප්‍රදේශ ඇතුළු හෝපිටිගම, ලබුඇටබැඳිගල වැනි වෙළෙඳ නගර ආශ්‍රිත ප්‍රදේශ මේ වණික් ග්‍රාමයේ පැවති ගම් පළාත් විය හැක.

එකල ශ්‍රී ලංකාවේ බටහිර වෙරළට මෙන්ම නැගෙනහිර වෙරළට විදෙස් වෙළෙඳ නැව් පැමිණි අතර ශිලා ලේඛන සාධක මෙන්ම ෆාහියන් වැනි දේශාටකයන්ගේ චාරිකා වාර්තා වල ද සඳහන් වන පරිදි බටහිර වෙරළට ග්‍රීක, රෝම හා ෆර්සියානු නැව් පැමිණි අතර අරාබි නැව් යේමනයේ සිට පැමිණි අතර චීන නැව් නැගෙනහිර වෙරළට පැමිණියේ ය. මේ වෙළෙඳුන් විසින් රෙදිපිළි, සුවඳ විලවුන් ඇතුළු විවිධ භාණ්ඩ ආනයනය කළ අතර මුතු, මැණික්, රන්, රිදී, කපුරෙදි හා බුදු පිළිම වැනි භාණ්ඩ අපනයනය කළේ ය. ලක්දිව නගර පන්සියයක් තිබුණ බව ත් ප්‍රධාන නගරය 'පැලසිමුන්ඩෝ' බව ත් ප්ලීනි පවසයි. පැලසිමුන්ඩෝ යනු අනුරාධපුර නගරය යි. ටොලමි අනුරාධපුරය නම්කර තිබෙන්නේ 'අනුරෝධ' නමිනි.

මෙම කෙටි විවරණයෙන් පැහැදිලි වෙන්නේ ඉතා පැරණි යුගයේ සිට ශතවර්ෂ විසිපහකට ආසන්න දීර්ඝ කාලයක් තුළ ලංකාද්වීපයේ ක්‍රියාත්මක වූ රාජ්‍යත්වය හා රජුගේ ප්‍රජාතාන්ත්‍රික පාලන ක්‍රමය යි. රාජ්‍ය පාලනය උදෙසා මහාසංඝරත්නය ද නිලධාරීන් ඇතුළු පොදු ජනතාව ද රජුට සහයෝගය ලබා දුන්හ. එපමණකු දු නොව රටේ ත්, භූමියේ ත් මේ කරුණු වලින් පැහැදිලි වන්නේ සියලු ස්වභාවික සම්පත්වලත් රාජ්‍ය හා ආගමික ආයතනවල ත් පැවැත්ම, සංවර්ධනය, නඩත්තුව, පරිහරණය, කළමනාකාරිත්වය හා සුරක්ෂිතතාව සියලු ම පර්ශ්වයන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය තුළින් ඉටු වූ බව යි. රජු රටේ භාරකරුවා වශයෙන් සියලු සම්පත් ආරක්ෂා කර ගැනීමට ත්, නඩත්තු කිරීමට ත්, ගොඩනැංවීමට ත්, දියුණු කිරීමට ත් බැඳී සිටියේ ය. ඒ සඳහා භික්ෂූන්වහන්සේ මඟ පෙන්වූහ. මහජනතාව ශ්‍රමයෙන්, දැනුමෙන් හා ධනයෙන් ද රජුට සහාය ලබා දුන් හ. රජුත්, භික්ෂූන්වහන්සේත්, පුරවැසියනුත් සාමූහික ව මහා වෙහෙර, විහාර, පංසල්, වැව්, පොකුණු හා රාජ්‍ය ආයතන ගොඩනැගුවා පමණක් නොව සිය දිවි දෙවෙනි කොට ඒවා නොයෙකුත් බලවේගවලින් ආරක්ෂා කර ගත්හ.

මේ අතර ජාතික හා ජාත්‍යන්තර වෙළෙඳාම ද අන්තර් ජාතික සංචාරක කර්මාන්තය ද වර්ධනය විය. එබැවින් විවිධ රටවලින් දිවයිනට පැමිණි වෙළෙන්දන් හා සංචාරකයන් අපේ සංස්කෘතික දායාද වැඳ පුදා ගෙන දැක බලා ගෙන සතුටු වූවා පමණක් නොව ඒ සම්බන්ධයෙන් ලොව පුරා පුළුල් ප්‍රචාරණයක් ලබා දුන් හ. මෙකී සියලු කණ්ඩායම්වල ප්‍රයත්නය නිසා වර්තමාන යුගය දක්වා ම අපට උදම් ඇණිය හැකි ජාතික මෙන්ම ජගත් සංස්කෘතික උරුමයකට හිමිකම් කීමට හැකි වී තිබේ. විශේෂයෙන්ම පැරණි රජවරු සිය බලය භාවිත කොට චිරාත් කාලයක් පවත්නා උරුමය ගොඩනැංවීමට ත්, නඩත්තු කිරීමට ත්, ආරක්ෂා කිරීමට ත්, මූලිකත්වය ගෙන ක්‍රියා කළ හ. භික්ෂූන් වහන්සේ ආගමික ආයතන රැකබලා ගැනීමෙහි ලා දිවිහිමියෙන් කටයුතු කළ ආකාරය ඓතිහාසික මූලාශ්‍රය වල මැනවින් පැහැදිලි කර ඇත. මෙරට පුරවැසියන් අපේ දායාද රැකගත්තේ මහාඅනර්ඝ වස්තූන් ලෙස සලකාගෙන ය. මේ අනුව වර්තමානයේ අප රටේ තිබෙන වටිනා සංස්කෘතික උරුමය එනම් භාෂා, සාහිත්‍ය, ආගම, ධර්මය, ඉතිහාසය, පුරාවස්තු සෞන්දර්යාත්මක අංග, ජන ක්‍රීඩා, සිරිත් විරිත්, සංස්කෘතිය සභ්‍යත්වය හා ශිෂ්ටාචාරය නොනැසී හා නොනසා තවත් චිරාත් කාලයක් පවත්වාගෙන යෑම පිණිස කටයුතු කළ යුතු ය. විශේෂයෙන් ම නූතන විශ්වීය මිනුම් අනුව ජගත් සංස්කෘතික උරුමයන් ශ්‍රී ලංකාවට හිමි වී තිබීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේයයන් වශයෙන් අපට මහත් අභිමානය කි.

අනුරාධපුර (අභයගිරි විහාරය, ජේතවන විහාරය, මහාවිහාරය) දඹුල්ලේ රන්ගිරි දඹුලු ලෙන් විහාරය, පොළොන්නරුවේ ආළාහන පිරිවෙන, මහනුවර (ශ්‍රී දළදා මාළිගාව, සතර දේවාලය, මහා විහාරද්වයය), සීගිරිය, ගාල්ලේ ඕලන්ද බලකොටුව හා සිංහරාජ අඩවිය ශ්‍රී ලංකාවේ ජාතික ජගත් උරුමයන් ලෙස යුනෙස්කෝ ආයතනය විසින් පිළිගෙන තිබේ. එයින් අනුරාධපුර, පොළොන්නරුව, දඹුල්ල යන ස්ථාන බෞද්ධ පූජනීය ආගමික ස්ථාන වන අතර සීගිරිය හා ගාලු කොටුව රාජකීය හෙවත් ලෞකික උරුමයන් ය. සිංහරාජ වනාන්තරය ස්වභාවික ජගත් උරුමය කි. ඒ හෙයින් මේ සියල්ල ම සමස්තයක් වශයෙන් ගෙන සළකන විට ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, සංස්කෘතික හා පාරිසරික උරුමයන් ලෙස ත් ස්මාරක ලෙස ත් සළකනු ලැබේ. එසේම මුළුමහත් බෞද්ධ ලෝකයේ ම අතිපූජනීයත්වයට පත් ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින මහනුවර ද ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩ සිටින මහාවිහාරය ද දඹුල්ල ජේතවනාරාමය, අභයගිරිය හා පොළොන්නරුව ද ජීවමාන බෞද්ධ පූජනීය ස්ථාන ලෙස ත් මහත් ගෞරවයට හා සැළකිල්ලට භාජනය වී ඇත.

යුනෙස්කෝව (UNESCO) විසින් ප්‍රකාශිත 'ජගත් සංස්කෘතික උරුමය ලේඛනයට' අනුව ජගත් සංස්කෘතික උරුමයක් ලෙස යම් ජාතික වස්තුවක් නම් කිරීම සඳහා ප්‍රධාන විශේෂ ලක්ෂණ හා ගුණාංග හයක් ඇති අතර එයින් එකකින් හෝ කිහිපයකින් හෝ එම පුරාවස්තුව යුක්ත විය යුතු ය. එසේම ඒවාට ප්‍රමිතියක් හා විශ්වාසනීයත්වයක් ද තිබිය යුතු ය.

එම විශේෂතා මෙසේ ය.

1. අදාළ සංස්කෘතික වස්තුවේ නිර්මාණ ලක්ෂණවලින් මානව බුද්ධි මහිමය ඉස්මතුවීම.
2. වාස්තුවිද්‍යා ස්මාරක, කලා, නගර සැලසුම් හා භූ රූපණ රටාවල සංවර්ධනාත්මක පදනමක් මත ලෝකයේ නියමිත සංස්කෘතික ප්‍රදේශයක් තුළ මානව ඇගයීම් උසස් ලෙස අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු වූ ආකාරය පෙන්නුම් කිරීම.
3. ජීවමාන හෝ විනාශ වූ ශිෂ්ටාචාරයක් හෝ සංස්කෘතියක් සම්බන්ධයෙන් විශිෂ්ට හෝ විශේෂ වූ වැදගත්කමකින් යුක්ත සාක්ෂිවලින් යුක්ත වීම.
4. මනුෂ්‍ය ඉතිහාසයේ විශේෂ අවස්ථාවක් නියෝජනය කරන ගොඩනැගිලි හෝ වාස්තුවිද්‍යාත්මක නිර්මාණ සමූහයක් හෝ භූරූපී නිර්මාණයක් හෝ සම්බන්ධ විශිෂ්ට නිදර්ශන වීම.
5. නැවත ප්‍රතිෂ්ඨාපනය නො කළ හැකි පමණට විනාශ වී හෝ විනාශ වෙමින් පවත්නා සංස්කෘතියක සාම්ප්‍රදායික මනුෂ්‍ය වාසස්ථාන හෝ භූරූප පෙන්නුම් කරන විශිෂ්ට නිර්මාණයක් වීම.
6. විශිෂ්ට වූ ද විශ්ව සාධාරණ වූ ද වටිනාකමකින් යුක්ත වන සිද්ධීන් හෝ ජීවමාන සම්ප්‍රදායයන් සමඟ ත් සෘජු වශයෙන් හෝ නිශ්චිත වශයෙන් සිතුම් පැතුම් හා විශ්වාස සමඟත් කලා කෘති හා සාහිත්‍ය කෘති සමඟ ත් සබඳතාවක් තිබීම යන ලක්ෂණ සය යි.

ඉහත සඳහන් ජාත්‍යන්තර නිර්ණායකයන්ට අනුරූප වන ජගත් සංස්කෘතික උරුමයන් ප්‍රධාන වශයෙන් වර්ග තුනකට බෙදා තිබේ.

1. ස්මාරක 2. ගොඩනැගිලි 3. ස්ථාන

යනුවෙනි. මෙහි ස්මාරක යනුවෙන් නම් කර තිබෙන්නේ පුරාවිද්‍යාත්මක අගයෙන් යුක්ත වාස්තුවිද්‍යාත්මක නිර්මාණ, ව්‍යුහයක් හෝ අංගෝපාංග, විශිෂ්ට ගනයේ මූර්ති, සිතුවම්, පුරාලේඛන, ලෙන් හා ඒ ආශ්‍රිත වාසස්ථාන කලාත්මක හෝ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන්ට අනුව සුවිශේෂී හා විශ්ව අගයෙන් සමන්විත අංග හා නිර්මාණ යි. ගොඩනැගිලි යනුවෙන් අදහස්

වන්නේ ගොඩනැගිලි සමූහයන් ය. එනම්, වාස්තුවිද්‍යාත්මක ස්වාධීනත්වය හෝ භූරූපමය ලක්ෂණ හේතුවෙන් ඓතිහාසික, කලාත්මක හෝ විද්‍යාත්මක මිණුම් අනුව විශිෂ්ට හා විශ්වීය වටිනාකමක් ඇති වෙන් වෙන් හෝ අන්‍යෝන්‍ය ලෙස සම්බන්ධ ගොඩනැගිලි සමූහයන් ය. ස්ථාන ලෙස සැලකෙන්නේ ඓතිහාසික, සෞන්දර්යාත්මක හා මානවවංශ විද්‍යාත්මක හෝ මානවවිද්‍යාත්මක වශයෙන් සැලකීමේදී අතිවිශිෂ්ට වූ ත් විශ්ව වූ ත් අගයකින් අනූන පුරාවිද්‍යා ස්ථාන, මානව නිර්මාණ සහ මානව හා ස්වභාවධර්මයේ සංයෝගයෙන් නිර්මාණය වූ ස්ථාන වේ.

මෙම වර්ගීකරණයට අනුව පැහැදිලි වන්නේ ජගත් සංස්කෘතික උරුම වස්තු ලෙස සැලකෙන්නේ මුළුමහත් මානව සංහතියට ම අයත් වන විශ්වසාධාරණ අසමසම නිර්මාණ බව යි. ඉහත සඳහන් කළ පරිදි දැනටමත් ශ්‍රී ලංකාවේ එවැනි වස්තු අටක් ජගත් සංවිධානය විසින් ජගත් සංස්කෘතික උරුමයන් ලෙස එක හෙළාම පිළිගෙන තිබේ. එයින් සිංහරාජ වනාන්තරය හැර අනෙක් හතම ආගමික සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන අද්විතීය ස්මාරකයන් ය. මිහින්තලේ ද මේ වන විට මෙම ලේඛනයට ඇතුළත් කිරීමට අදාළ ව කටයුතු කර ඇති අතර ශ්‍රී ලංකාවේ මුල්ම බෞද්ධ මධ්‍යස්ථානය හා ශ්‍රී ලාංකේය සංස්කෘතියේ නිජබිම වූ මිහින්තලේ සමස්ත ලෝකයේ ම සම්භාවනාවට භාජනය විය යුතු අතිපූජනීය ස්ථානය කි.

නූතන ජගත් සංස්කෘතික උරුම සංකල්පය හඳුන්වා දීමට වසර දහස් ගණනකට පෙරම අපේ පැරණි රජවරුන් විසින් එම සංකල්පය ප්‍රායෝගිකව ම ක්‍රියාත්මක කර තිබෙන බව ශ්‍රී ලංකාවේ ආගමික, පුරාවිද්‍යාත්මක, සංස්කෘතික හා සමාජ ඉතිහාසය විශ්ලේෂණය කිරීමේදී ඉතා පැහැදිලි වෙයි. ක්‍රි. පූ. තුන්වන සියවසේදී මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස මහරජතුමාට දේශනා කළේ 'තමනුත්, නැයොත්, නොනැයොත් හැර තවත් අපමණ සතුන් මේ බිමේ ජීවත්විය යුතු බව යි. එසේම තමන් දන්නා හා නොදන්නා අඹ ගසත් මේ අඹ ගසත් හැර තවත් අතිවිශාල ප්‍රමාණයක් ගස්වැල් මේ භූමියේ තිබෙන බව යි. ඒ සියල්ලන්ට ම හා සියල්ලට ම මේ ලෝකයේ ජීවත් වීමට ද එකසේ අයිතිය තිබෙන බව යි. එමතු ද නොව මහරජු මේ භූමියේ භාරකරුවා මිස අයිතිකරුවා නොවන බව යි. එයින් ගම්‍ය වන්නේ මිනිසා, සතා සිව්පාවා, ගහකොළ, හා මහපොළව සමස්ත ලෝකයේ ම දායාදයක් බව යි. දුටුගැමුණු රජතුමා විසින් පරසතුරු ආක්‍රමණ සමනය කර වෙහෙර විහාර මහවැව් ඉදි කළේ ත් බුද්ධශාසනය ආරක්ෂා කරමින් එය වර්ධනය කළේ ත් මුළු මහත් ලෝකයාගේ ම අර්ථසිද්ධිය සඳහා

මිස රජසැප උදෙසා නොවේ. මහාපරාක්‍රමබාහු රජු බුද්ධශාසනය සුද්ධකර, නගා සිටුවා මහා වෙහෙර විහාර වැව් පොකුණු ඉදිකර රට බත බුලතින් සරු කළේ සියලු ලෝවැසියන්ගේ හිතසුව පිණිස ය." එතුමාගේ ඒ උතුම් පරමාර්ථය එතුමා විසින් පිහිටුවන ලද පදවිය ටැම් ලිපියේ සඳහන් වන්නේ මෙලෙසිනි.

"ඉදං ලංකාධිනාථෙන
ශ්‍රී පරාක්‍රමබාහුනා
කාරිතං විශ්වලෝකාර්ථ
කායවාක්‍යපාරිකාත්මනා"

"මුළු ලොවට වැඩ සැලැස්වීමෙහි තමන්ම නිරත වන, ශ්‍රී පරාක්‍රමබාහු ලංකාධිපති විසින් මෙය (මෙම වැව) කරවන ලදී."

'බැන්දැ නී ගඟවැවු
සිරිලකැ ද කෙත් කරවා
සියල් දිය රඳවා පැරැ
කුම්බා නිරිඳු කෙළ මේ'

'ගංගාවල් හරහා අමුණු බැඳ වැව් තනවා, සිරිලක කෙත් කරවා, සමස්ත ලෝකයා ම සතුටු කරවා පැරකුම්බා නිරිඳා' මේ (වැව)කළේ ය.

මේ අනුව පැරණි ශ්‍රී ලාංකේය රජවරුන් විසින් ශතවර්ෂ 25 කට පෙර සිට ලෝකාර්ථ සිද්ධිය හෙවත් සියලු ලෝ වැස්සන්ගේ අභිවෘද්ධිය පිණිස නැතහොත් ජගත් ප්‍රජාවගේ යහපත පිණිස කටයුතු කළ ආකාරය ඉතා පැහැදිලි ය. එසේ කිරීමට ශ්‍රී ලාංකේය පොදු ජනතාවගෙන් ද ඔවුන්ට අනූපමේය සහයෝගයක් ලැබුණි. අපේ පැරණි මුතුන්මිත්තන්ගේ සිත්සතන් තුළ ද තිබුණේ ආත්මාර්ථයට වඩා පරාර්ථ චරියාව යි. ඔවුන් ද සැමවිට ම කල්පනා කළේ මා මෙය කරන්නේ රටේ, ජාතියේ, ආගමේ හා අනාගත පරම්පරාවේ යහපත උදෙසා ය යන හැඟීමෙනි. එබැවින් අපේ ආදී මුතුන්මිත්තන් කිසිවෙකුට පොදු වැඩවලදී වැටකඩොලු, සීමා මායිම්, ආගම් කුළ භේද නොවී ය. එබැවින් ඔවුන් කරන සියලු කටයුතු ජගත් ප්‍රජාවගේ යහපත උදෙසා ම විය.

පොදු ජනතාව නැතහොත් පුරවැසියන් ලෙස ප්‍රධාන වශයෙන් ගිහි පැවිදි දෙපිරිස ම සැලකිය හැකි ය. ශ්‍රී ලංකාවේ මේ මහා නිර්මාණ බිහිකරන ලද්දේ රජුත් මහාසංඝරත්නය ත් සමග ම ජනතාවත් එක්ව ය. එසේම එය

ආරක්ෂා කර ගත්තේ ද නඩත්තු කළේ ද සංවර්ධනය කළේ ද මෙකී පාර්ශ්ව තුන විසිනි. මධ්‍යතන යුගය වන විට ද්‍රවිඩ රජවරුන්, පූජකවරුන් හා වැසියන් ද ඊට සම්බන්ධ වූ අතර ප්‍රාග් නූතන යුගය වන විට මුස්ලිම්වරුන් (ඉස්ලාම් ආගමිකයන්) ද කතෝලික හා ක්‍රිස්තියානි ආගමිකයන් ද ඊට සම්බන්ධ වී සිටිති. වර්තමානයේ මෙකී සෑම පාර්ශවයට ම අයත් නැතහොත් සමස්ත ශ්‍රී ලාංකේය ජනතාව ම ජාතික සහ ජගත් සංස්කෘතික උරුමයේ අයිතිකරුවන් ද භාරකරුවන් ද ආරක්ෂකයන් ද වන්නා හ. ඒ සමගම මේ රටේ අතිපැරණි ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා ආගමික සංස්කෘතික උරුම ස්ථාන, ස්මාරක, ගොඩනැගිලි හා පුරාවස්තුවලින් අතිබහුතරය බෞද්ධාගමික උරුමයන් ය. එබැවින් මහාසංඝරත්නය ත් බෞද්ධ ජනතාව ත් ඒවා රැක බලා ගැනීමට ත් වැඩිදියුණු කර ගැනීමට ත් උත්සුක විය යුතු ය. ඒ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, ආගමික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල යන රජයේ ආයතන කිහිපයක් ද ක්‍රියාත්මක වෙමින් තිබේ. එහෙත් එම ආයතන මගින් ක්‍රියා කළ හැකි ප්‍රමාණය සීමා සහිත ය. එය ද මහාසංඝරත්නයේ හා බොදු මහ ජනතාවගේ සහයෝගය නොවුණා නම් ඉටු කළ නොහැකි ය. එහෙත් වාසනාවට මේ ස්ථාන බහුතරයක් භික්ෂූන්වහන්සේ වැඩ වසන ස්ථානවීම ත් ඒවා ඉතා ගෞරවයෙන් හා පූජනීයත්වයෙන් සළකන බෞද්ධාගමික ජනතාව ඒවා නිරන්තරයෙන් රැකබලා ගැනීම ත් නිසා අපේ සංස්කෘතික උරුමය සුරක්ෂිත වී තිබේ. ශ්‍රී ලාංකිකයන් සතුව තිබෙන මේ අතීත ජගත් උරුමය පිළිබඳව අපට උදම් ඇනීමට හැකිවී තිබෙන්නේ ඒ නිසා ය. ලෝකවාසීන්ගේ සම්භාවනාවට පාත්‍ර වූ උක්ත ස්ථාන අට පමණක් ජගත් සංස්කෘතික උරුමය ලේඛනයට ඇතුළත් වී ඇතත් එසේ නම් නොකළ තවත් විශාල ප්‍රමාණයක් දීපව්‍යාප්ත ව දිවයිනේ සතර දිග් භාගයේ ම ජගත් සංස්කෘතික උරුම නිර්ණායකයන්ට සාකල්‍යයෙන් ම අයත් වන ජාතික සංස්කෘතික උරුම ස්ථාන, ස්මාරක, ගොඩනැගිලි හා පුරා වස්තූන් පිහිටා තිබේ. ඒවා ජගත් උරුම ලෙස නම් කර නැතත් එසේ නම් කිරීමට සෑම අංශයකින් ම සුදුසු ය. පැරණි වෙහෙර විහාර, දාගැබ්, ප්‍රාග් ඓතිහාසික ස්ථාන, වැව්, පොකුණු, බුද්ධ, බෝධිසත්ව හා දේව ප්‍රතිමා ආදිය ඒ අතර වෙයි. එහෙයින් ඒ සියල්ල ආරක්ෂා විය යුතු ය. ඒවා ද මහජනතාවගේ විශේෂයෙන් ම භික්ෂූන්වහන්සේගේ අවධානයට යොමු වී තිබෙන හෙයින් ඒවායේ ආරක්ෂාව සැලසී ඇත.

විශේෂයෙන් ම මේ ජාතික උරුමය භික්ෂූන්වහන්සේගේ භාරකාරත්වය යටතේ පවත්නා බැවින් උන්වහන්සේට මේවා විවිධ උවදුරු හා බලවේගවලින්

තවදුරටත් දැඩි ව ආරක්ෂා කරගැනීමෙහි ලා බලවත් යුතුකමක් හා වගකීමක් පැවරී තිබේ. විශේෂයෙන් සංස්කෘතික අගය මෙන්ම එයට ත් වඩා ඒවායේ තිබෙන ආගමික සම්බන්ධතාව බලවත්වන බැවිනි. අනාදිමත් කාලයක් තිස්සේ නොයෙකුත් බාධක හා කරදර හිරිහැර මධ්‍යයේ මේ වස්තු සම්භාරය ආරක්ෂා කර ගත් සංඝ සමාජයට තවදුරටත් වැඩිවැඩියෙන් ඒවා ආරක්ෂා කර ගැනීමට ත්, නඩත්තු කිරීමට ත්, සංරක්ෂණය කිරීමට ත් ප්‍රවර්ධනය කිරීමට ත් කාලය පැමිණ තිබේ.

විශේෂයෙන් ල ජගත් සංස්කෘතික උරුමය කේන්ද්‍ර කර ගත් ශ්‍රී ලංකාවේ සංස්කෘතික සංචාරක ව්‍යාපාරය වර්ධනය මෙන්ම ඒවායේ ඇති ආගමික, පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, සමාජීය හා සංස්කෘතික අගයට මූල්‍යමය අගයක් ද ආරෝපණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලාංකේය ජාතික හා ජගත් උරුමය නිසා අංශ දෙකක් වර්ධනය විය. එකක් නම් එම උරුමය වෙත සංචාරකයන් ආකර්ෂණය කිරීම සඳහා අදාළ ස්ථානවල සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීමට ත් පුරාවස්තු සංරක්ෂණය කිරීමට ත් මැනවින් නඩත්තු කිරීමට ත් ඒවා ප්‍රවර්ධනය කිරීමට ත් ආරක්ෂා කිරීමට ත් පියවර ගැනිණි. අනෙක් අතින් මෙම උරුමයන්ට ඍජුව හෝ වක්‍රව මූල්‍යමය අගයක් ආරෝපණය වීම නිසා පුරාවස්තු පැහැරගන්නන්, මංකොල්ලකරුවන්, අපනයනය කරන්නන්, නිධන් සොරුන් හා අනවසර ඉඩම් අත්පත් කරගෙන සිටින්නන් (තමන් ප්‍රයෝජනය ගන්නා ඉඩම රජයට අයිති වේ යැයි ඇති වූ බිය නිසා) විසින් පුරාවස්තු විනාශයක් සිදුකරමින් බරපතළ අපරාධයක් කරනු දැකිය හැකි ය.

ලෝකයේ බොහෝ රටවල පුරාවස්තු හෝ සංස්කෘතික වස්තු මංකොල්ලය දීර්ඝ කාලයක් තිස්සේ පැවැතියාක් මෙන් ශ්‍රී ලංකාවේ ද පැරණි යුගයේ සිට තිබුණි. සාමාන්‍ය ජනතාව පමණක් නොව මෙරට සමහර පාලකයන් ද මේ බලවත් වරදට වගකිව යුතු ය. විශේෂයෙන් ම මෙරට ආක්‍රමණය කළ විජාතිකයන් වන චෝළ, පාණ්ඩ්‍ය, ද්‍රවිඩ, පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි පාලකයන් ඒ අතර විශේෂයෙන් සඳහන් කළ යුතු ය. වස්තු තණ්හාවෙන් මඬනා ලදුව අන්ධ ආගමික භක්තියෙන් මුළා වූ චෝළ නාග රජු විජාතිකයන් කෙරෙහි ද අන්ධ ආගමික භක්තියෙන් ද මුළා වී බලයෙන් වල්මත් වූ සීතාවක රාජසිංහ රජ වැනි ලක්දිව රජවරුන් ද විශාල සංස්කෘතික විනාශයන්ට වගකිව යුතු ය. සමස්තයක් වශයෙන් සිවිල් යුද්ධ හා විදේශ ආක්‍රමණ වැනි යුද්ධ නිසා ද සංස්කෘතික විනාශයක් සිදුවිය. එසේ මෙරට ඉතිහාසයේ වරින්වර එවැනි විනාශයන් සිදුවුව ද වර්තමානයේ

පමණ එය අධික නොවී ය. පසුගිය දසක දෙක තුන තුළ විවිධ පුද්ගලයන් විවිධ ක්‍රම භාවිත කරමින් කරන විවිධ සංස්කෘතික උරුම විනාශය අති විශාල ය. ඒ ප්‍රමාණය කෙසේවත් අතීතය සමග සැසඳීම කළ නො හැකි ය. වත්මන් සංචාරක ව්‍යාපාරය තවදුරටත් වර්ධනය වෙමින් පවත්නා හෙයින් සංස්කෘතික උරුමය හෙවත් පුරාවස්තු විනාශය තවදුරටත් ඉහළට යනු ඇත. මෑත යුගයේ පුරාවස්තු විනාශයට තුඩුදුන් සාධක කිහිපයක් ම තිබේ.

එයින් ප්‍රධාන හේතුවක් වන්නේ ඉහත කී පරිදි සංස්කෘතික සංචාරක ව්‍යාපාරය මඟින් ඇති වූ නව අතුරු ප්‍රතිඵල යි. එසේම සංස්කෘතික වස්තුවලට මූල්‍යමය අගයක් ලැබීම ද තවත් හේතුව කි. තවත් කරුණක් වන්නේ පුරාවස්තු හෝ පුරාවිද්‍යාත්මක ස්ථානවල නිධන් වස්තු තිබේ ය යන මිථ්‍යාව යි. පුරාවස්තුවලට සියලු උවදුරු දුරු කිරීමේ ත් සියලු සම්පත් උදා කිරීමේ ත් පූර්ව බලයක් ඇතැයි යන මිථ්‍යාදෘෂ්ටිය තවත් සාධකය කි. අගතිගාමී ආගමික කණ්ඩායම් තුළ ඇති පුරාවස්තු හෝ පුරාවිද්‍යා ස්ථාන කෙරෙහි ඇති විනාශකාරී විරුද්ධත්වය ද තවත් කරුණකි.

මෙම හේතු සාධක පදනම් කරගෙන නොයෙකුත් වටිනා හා වැදගත් ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ විවිධ ගණයේ පෞරාණික වස්තු රාශියක් විනාශ කර තිබේ. ඒ අතර චංචල පුරාවස්තු එනම්, බුද්ධ, බෝධිසත්ව, දේව හා වෙනත් ප්‍රතිමා ආදිය සොරකම් කිරීම හා විනාශ කිරීම එක් කොටස කි. නිශ්චල ස්ථාන, ස්මාරක, ගොඩනැගිලි යනාදිය තවත් කොටස කි. උදාහරණ වශයෙන් ශ්‍රී දළදා මාළිගාවට හා ශ්‍රී මහා බෝධියට ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල කිරීම, විශාල ප්‍රමාණයේ සිටි, හිඳි හා ඔත් පිළිම නිධන් පිපාසාව නිසා විනාශ කිරීම යනාදිය මේ ගණයට ගත හැකි ය. තුන්වන වර්ගය නම් පුරාවිද්‍යා කැණීම් පිළිබඳ ව නොදන්නා පිරිස විසින් හෝ විවිධ සංවර්ධන කාර්යයන්වල නිරතවන්නන් (වැව් ප්‍රතිසංස්කරණය කිරීම, ඇළ මාර්ග කැපීම, මාර්ග සකස් කිරීම, විදුලිය සැපයීම, නවීන ගොඩනැගිලි ඉදිකිරීම වැනි) විසින් පුරාවිද්‍යා ගොඩනැගිලි, පුරාවිද්‍යා ස්ථාන හෝ පුරාවිද්‍යා ස්මාරක විනාශ කිරීම යනාදිය ප්‍රධාන වෙයි. තවත් විනාශකාරී බලවේග දෙකක් වන්නේ ඉඩම් අයිතිය, අපනයනය සහ සමාජීය දෛනික කටයුතු නිසා වන විනාශය යි. ස්වාභාවික බලවේග මඟින් ද පුරාවස්තු විනාශ වෙයි. මේ සියල්ලටමත් වඩා ප්‍රබලතම විනාශය සිදුවන්නේ නිධන් සොරුන් විසින් කරන සාපරාධී ක්‍රියාවන් මඟිනි.

මොවුන් අතින් හෝ එකී මාර්ගවලින් විනාශ වන පුරාවස්තුවලින් අතිබහුතරය අයත් වන්නේ බෞද්ධාගමික සංස්කෘතික උරුමය ගණයට ය. එහෙයින් භික්ෂූන් වහන්සේ ත් පොදු බෞද්ධ ජනතාව ත් මේ සම්බන්ධයෙන් දැඩි ලෙස අවධානය යොමු කළ යුතු ය. විශේෂයෙන් යන්ත්‍ර මන්ත්‍රකරුවන් ද ගුරුවරුන් වැනි උගතුන් ද, රජයේ විවිධ නිලධාරීන් ද ව්‍යාපාරිකයන් ද ආරක්ෂක අංශවල සේවය කරන්නන් ද මේ කටයුතුවල බහුල වශයෙන් නිරත වන බව පෙනේ. අවාසනාවට මෙන් සමහර භික්ෂූන්වහන්සේ හෝ භික්ෂු ප්‍රතිරූපකයන් ද මේ විනාශකාරී කටයුතුවලට සම්බන්ධ වී සිටීම ඉතා කණගාටුදායක කරුණකි. මේ අනුව සළකන විට පුරාවස්තු හෝ ජාතික උරුමය ආරක්ෂා කර ගැනීමට බැඳී සිටින සාමාන්‍ය නූගත් ජනතාවට වඩා වගකිව යුතු උගත් උදවිය අතින් ඒවාට වන විනාශය ඉතා විශාල ය. ශ්‍රී ලංකාවේ ජාතික සම්පතක් වූ ජගත් සංස්කෘතික උරුමය මෙසේ විවිධ කණ්ඩායම් හෝ පුද්ගලයන් විසින් වනසා දැමීමට තුඩුදුන් හේතු සාධක කිහිපයක් තිබෙන බව පෙනේ. ඒ අතරින් සමහර භික්ෂූන් හා ගිහියන් අනවබෝධය නිසා පුරාවිද්‍යාත්මක වස්තුවල පෞරාණික හා ආගමික අගයට වඩා මූල්‍යමය අගය තක්සේරු කරන අතර මුදල් උපයා ගැනීම පිණිස ඔවුන් තුළ ඇතිවන තණ්හාව ප්‍රධාන හේතුව කි. හිතවත්කම, ඥාතීත්වය, ප්‍රභූත්වය, හෝ දායකකම සළකා ඔවුන්ට සංග්‍රහ කිරීමට ත් ඔවුන්ගෙන් ලාභාපේක්ෂාවන් ඉටුකර ගැනීමට ත් පුරාවස්තු යොදා ගැනීම තවත් එකකි. ලෞකික හා ලෝකෝත්තර විමුක්තිය හෝ යහපත පෞරාණික වස්තු මඟින් සැලසේ යැයි යන මිථ්‍යා විශ්වාසය මත කරන විනාශය තව එකකි. තවත් වැදගත් හේතුවක් නම් දේශීය හා විදේශීය සංචාරකයන් කෙරෙහි මුළාවීම නිසා ඔවුන්ට පුරාවස්තු පවරා දීම හෝ පරිත්‍යාග කිරීමට පෙළඹීම යි. එසේම පෞද්ගලික හෝ ආයතනික (ආගමික) අවශ්‍යතාවන් මත සංස්කෘතික දේපොළ විනාශ කරන පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට හෝ ආයතනවලට සම්බන්ධ වී උරුමය පැහැරගැනීම, අස්ථානගත කිරීම හෝ විනාශ කිරීමට කටයුතු කිරීම තවත් කරුණ කි. අනවබෝධය නිසා පුරාවස්තුවල පෞරාණික වටිනාකම නොදැන ඒවා අලංකාර කිරීමට නවීකරණයට ලක් කිරීමට ඇති ආශාව ද වැදගත් වෙයි. සංස්කෘතික වස්තු ඇති ස්ථානවල අධිපතියන් හෝ භාරකරුවන් හෝ අයිතිකරුවන් විසින් ඒවා අනිසි ලෙස පරිහරණය කිරීම, අන්ධ භක්තිය, ගෞරවය හා බලවත් ශ්‍රද්ධාව නිසා සිදුවන හානිය ද සැළකිය යුතු එක කි.

මෙලෙස විවිධ හේතු මුල්කරගෙන කරගෙන යන මේ සංස්කෘතික වස්තු විනාශය වළක්වා ගැනීමට නැතහොත් අවම කර ගැනීමටවත් පූජ්‍ය

හා පූජක පක්ෂයට ත් සියලුම පුරවැසියන්ට ත් මේ සම්බන්ධයෙන් මනා අධ්‍යාපනයක් හා අවබෝධයක් ලබාදීමේ වැඩපිළිවෙළක් තිබිය යුතු ය. ඇතැම් පෞද්ගලික ස්ථානවල ත් (නිවාස වැනි) පොදු ස්ථානවල ත් (පන්සල්, රජය සතු ආයතන වැනි) දැනට තිබෙන වටිනා සංස්කෘතික උරුම වස්තුවලට තමාගේ ඇවෑමෙන් කුමකින් කුමක් වේදැයි ඒවායේ වර්තමාන භාරකරුවෝ මහත් බියකින් පසු වෙති. දැනට සෑම අංශයක ම පවත්නා දුර්වලතා හා වංචනික කටයුතු පිළිබඳ සළකන විට පෞද්ගලික හෝ රාජ්‍ය නොවන පොදු ආයතනවල තිබෙන සංස්කෘතික වස්තු රජයේ ආයතනවලට පවරා දීමෙන් සිදුවිය හැකි විනාශය ගැන කල්පනා කරන විට ඒවා තිබෙන තැන්වල තිබෙන ආකාරයෙන් ම තිබීම වඩා හොඳයැයි කෙනෙක් කල්පනා කළහොත් එහි ද අසාධාරණයක් නැති බව පෙනේ.

කුමන හේතුවක් මත කුමන පුද්ගලයෙක් විසින් සංස්කෘතික වස්තුවක් කුමන ආකාරයෙන් විනාශ කළ ද එහි අවසාන ප්‍රතිඵලය එකම ය. එහෙයින් මෙම විනාශය වැළැක්වීම සඳහා සුදුසු විධිමත් වැඩපිළිවෙළක් යෙදීම ඉතා කාලෝචිත ය. එහිදී ගත යුතු ක්‍රියාමාර්ග කිහිපයක් ම යෝජනා කළ හැකි ය. විහාරාරාම ඇතුළු සංස්කෘතික උරුමය සතු ආයතනවල පරිපාලනය, කළමනාකරණය හා නඩත්තුව කළ යුතු ආකාරය පිළිබඳ ව මනා අධ්‍යාපනයක් හා අවබෝධයක් ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම ලබාදීම මුලින් ම කළ යුතු ය. සංස්කෘතික උරුමය සුරක්ෂිත කිරීම හා විනාශ කිරීම සම්බන්ධ ජාතික හා ජාත්‍යන්තර නීති රීති හා රෙගුලාසි පිළිබඳ ව පූජ්‍ය-පූජක දෙපාර්ශ්වය ඇතුළු පොදු මහජනතාව දැනුවත් කළ යුතු ය. සංස්කෘතික දේපොළ පිළිබඳ කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල (බෞද්ධ ත්‍රෛනිකාය, හින්දු කතෝලික සභාව, ඉස්ලාම් පල්ලිය) දැනට මේ සම්බන්ධයෙන් පවත්නා ආයතනික නීති රීති, විනය ක්‍රියා මාර්ග වැඩි හා දැඩි කිරීම හා ඒවා තරාතිරම නොසලකා ක්‍රියාත්මක කිරීම කළ යුතු ය. සංස්කෘතික වස්තු මංකොල්ලයකට හෝ විනාශයකට සම්බන්ධ වන්නන්ගේ තරාතිරම නොබලා දැඩි දඬුවම් පැමිණවීම අත්‍යවශ්‍ය වේ. ජාතික හෝ ජගත් සංස්කෘතික උරුමයන්ගේ මූල්‍යමය වටිනාකමට වඩා ඒවා පෞරාණික සංස්කෘතික හා ආගමික වශයෙන් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් වටිනා බව හා වැදගත් වන බව සියල්ලන්ට අවබෝධ කර දීම ඉතා වැදගත් වේ. සංස්කෘතික උරුමය ඇති ආගමික හා ආගමික නොවන ආයතනවල භෞතික හා මානව අවශ්‍යතා පිරිමසනු පිණිස පුරාවස්තු මිල කිරීම වැළැක්වීම සඳහා රජය හෝ ප්‍රාදේශීය පරිපාලන ඒකක මගින් ඒ ආයතනවලට හැකි පමණ මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම ඉතා සුදුසු ය. කුමන හේතුවක් නිසා හෝ කුමන ආකාරයේ ආයතනයක හෝ

තිබෙන සංස්කෘතික වස්තුවක් වේවා රාජ්‍ය භාරකාරත්වය හෝ සාමූහික භාරකාරත්වයක් යටතේ තබනවා මිස පෞද්ගලික භාරකාරත්වයකට කිසිවිටෙකත් පත් නොකළ යුතු ය. ඒ සමඟ ම සමස්තයක් ලෙස පුරවැසියන් වශයෙන් ජාතික හා ජගත් සංස්කෘතික වස්තු ආරක්ෂා කිරීමෙහි ලා ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම ජාතික වශයෙන් ඇති වගකීම් හා යුතුකම් පිළිබඳව මනා අවබෝධයක් හා අධ්‍යාපනයක් ලබාදීමට ත් ඔවුන් තුළ ආධ්‍යාත්මික හා ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීමට ත් සුදුසු ක්‍රමවත් හා විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු ය.

මෙලෙස සියලු අංශ කෙරෙහි අවධානය යොමු කළ යුත්තේ සංස්කෘතික වස්තු විනාශය හුදෙක් එක කරුණක් නිසා සිදුවන්නක් නොව ඒ හා බැඳුන සමාජ, ආර්ථික, ආගමික, ආධ්‍යාත්මික, දේශපාලනික, සදාචාරාත්මක හා නෛතික යනාදී වශයෙන් කරුණු රාශියක් එකිනෙකට සම්බන්ධ වී ඒවා එකම ජාලයක් ලෙස ක්‍රියාත්මක වීම තුළින් සිදුවන්නක් බැවිනි.

නිදහස් රාජ්‍යයක් වූ අපේ රටේ ජනතාවට මහත් අභිමානයක් වූ ජාතික සංස්කෘතික උරුමය හා ජගත් සංස්කෘතික උරුමය අතීත ශ්‍රී ලාංකේය රජදරුවන් බිහිකර හදා වඩා සංවර්ධනය කර ආරක්ෂා කර ගත්තා සේ වර්තමාන යුගයේ ද රාජ්‍යය ත් රජතුමා ත් අපේ අගනා සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීමෙහි ලා කැප වී සිටීම අත්‍යවශ්‍ය කරුණ කි. ගෝලීයකරණය වීම නිසා ශ්‍රී ලංකාව වැනි ස්වාධීන කුඩා රටවල උරුමය වැනි වටිනා සම්පත් රැකගැනීම රාජ්‍ය බලය නොමැතිව කෙසේවත් කළ නොහැකි දෙයකි. වාසනාවට මෙන් ආගම, භාෂා, සාහිත්‍ය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සංස්කෘතිය, සභ්‍යත්වය හා ශිෂ්ටාචාරය අගය කරන රට ජාතිය පිළිබඳ ආදරය කරන දේශීය හදවත් ඇති නායකයෙක් රටේ රාජ්‍ය පාලකයා වීම නිසා ජාතික හා ජගත් සංස්කෘතික උරුමය පෙරට ත් වඩා සුරක්ෂිත වනු ඇතැයි සිතිය හැකි ය. එතුමාට සහය වීම පිණිස භාෂා, සාහිත්‍ය, සංස්කෘතිය, ඉතිහාසය, පුරාවිද්‍යාව හා ජාතික උරුමය පිළිබඳ මනා අවබෝධයක් දැනුමක් හා ආදරයක් තිබෙන ඇමතිවරයෙකු ද සිටින බැවින් අපේ උරුමයේ අනාගතය පිළිබඳ අපට සතුටු විය හැකි ය.